බුදුසරණ

# මිහින්තලා ලේක්හවුස් ආලෝක පූජාවෙන්...





මිහින්තලා ලේක්හවුස් ආලෝක පූජාව පනස් වැනි වරටත් මිහින්තලේ රජමහා විහාරාධිපති වලවාහැංගුණවැවේ ධම්මරතන හිමියන්ගේ අනුශාසකත්වයෙන් උත්කර්ෂවත් අයුරින් පැවැත්විණි. ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ මෙහෙයවීමෙන් එහි සභාපති හා කළමණාකාර අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී බන්දුල පද්මකුමාර මහතාගේ මගපෙන්වීමෙන් ලංකා විදුලි බල මණ්ඩලයේ සම අනුග්‍රහයෙන් අබාන්ස් ආයතනයේ බැතිබර දායකත්වයෙන් සිදුකැරිණි. සමාරම්භක දිනය (3 වැනිදා) විදුලිආලෝකය විවෘත කිරීම විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ ඇමති රංජිත් සියඹලාපිටිය, උතුරුමැද පළාත් ආණ්ඩුකාර කරුණාරත්න දිවුල්ගනේ මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් සිදු වූ අතර එම අවස්ථාවට පාර්ලිමේන්තු මන්ත්‍රී ශෙහාන් සේමසිංහ, පළාත් ඇමති එච්. බී. සේමසිංහ, අනුරාධපුර මහ දිසාපති මහින්ද සෙනෙවිරත්න, ලේක්හවුස් කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ සීලරත්න සෙනරත් සහ මෙහෙයුම් අධ්‍යක්ෂ උපුල් දිසානායක මහත්වරුද සහභාගි වූහ.



ආලෝක පූජාවේ දෙවන දිනය වූ 4 වනදා විදුලි ආලෝකය විදුලි බල හා බලශක්ති ඇමති පාඨලී චම්පික රණවක, ජාතික උරුමයන් පිළිබඳ ඇමති ආචාර්ය ජගත් බාලසූරිය, ගොවිජන සේවා හා වනජීවී ඇමති එස්.එම්. චන්ද්‍රසේන, ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමති ලක්ෂ්මන් යාපා අබේවර්ධන, උතුරු මැද පළාත් සභා මන්ත්‍රී රංජිත් සමරකෝන්, ලංකා විදුලි බල මණ්ඩලයේ සභාපති මහාචාර්ය විමලධර්ම අබේවික්‍රම මහත්වරුන් අතින් විවෘත වූහ. මිහින්තලා රජමහා විහාරාධිපති වලවාහැංගුණවැවේ ධම්මරතන හිමි, මැලිබන් ආයතනයේ විධායක අධ්‍යක්ෂ ඒ.ජී විමලසිරි ලේක්හවුස් ආයතනයේ අධ්‍යක්ෂවරුන් වන උපුල් දිසානායක, සීලරත්න සෙනරත්, රසාංග හරිස්චන්ද්‍ර, සාමාන්‍යාධිකාරී අභය අමරදාස, සමාගමේ ලේකම් කුමුදු ගුණවර්ධන මහත්මිය, අලෙවි හා ශාඛා කළමනාකාර සුනිල් සෙන්දනායක, සුභසාධන හා මෙහෙයුම් කළමනාකාර මහේන්ද්‍ර රොද්‍රිගු, ලංකා විදුලි බල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී ප්‍රියන්ත වික්‍රමසූරිය මහත්වරුද මේ අවස්ථාවට සහභාගි වූහ.



5 වැනිදා විදුලි ආලෝකය විවෘත කිරීම අනුරාධපුර මහ දිසා පති මහින්ද සෙනෙවිරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති අයුරු. එම අවස්ථාවට සහභාගි වූ මිහින්තලා රජමහා විහාරාධිපති වලවාහැංගුණවැවේ ධම්මරතන හිමි, ලේක්හවුස් කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ සීලරත්න සෙනරත්, නීති අධ්‍යක්ෂ රසාංග හරිස්චන්ද්‍ර මිහින්තලා ප්‍රාදේශීය සභාවේ සභාපති යූ.බී. සිරිසේන, මිහින්තලේ ප්‍රාදේශිය ලේකම් රුවන් ඒකනායක මහත්වරුද මෙහි වෙති.



මිහින්තලා ආලෝක පූජාවට සමගාමීව ලේක්හවුස් ආයතනය මිහින්තලේ පතිරාජ තෙන්නකෝන් විද්‍යාලයේ ඉදිකළ "සෙල්ලම් මිදුල" ලේක්හවුස් මෙහෙයුම් අධ්‍යක්ෂ උපුල් දිසානායක, කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ සීලරත්න සෙනරත් මහත්වරුන් විසින් විවෘත කළ අයුරු.
මිහින්තලේ ප්‍රාදේශිය ලේකම් රුවන් ඒකනායක මහතාද මෙහි වෙති.



ලංකාවි සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම අනුග්‍රහයෙන් සංවිධානය කළ පොසොන් ධර්ම දේශනාවට දෙඬන්ගොඩ අස්සජී නා හිමියන් වෙත උපුල් දිසානායක මහතා විසින් ආරාධනා කළ අයුරු.

*ඡායාරූප*
*කිත්සිරි වනසිංහ*
*අමිල ප්‍රභාත් වනසිංහ*



කථික තරගයේ ජ්‍යෙෂ්ඨ අංශයේ ප්‍රථමයාට කුසලානය ප්‍රදානය කිරීම

වර්ෂ 2012 ක්වූ ජූනි 11 වනදා සඳුදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

Back